"දෙමළ බසින් - සිංහල බසට භාෂා පරිවර්තනය"

මගේ අංකය: NP/19/11/Dept/Cir

2016.03.29

**චක්‍රලේඛ අංකය: 03/2016 ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, උතුරු පළාත.**

**සියළුම ග්‍රාම සංවර්ධන නිලධාරීන් වෙත,**

අපගේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරනු ලැබ, ක්‍රියාන්විත වන ග්‍රාම සංවර්ධන සමිතිවලින් හා කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවලින් සිදු කරනු ලබන කර්මාන්ත ක්‍රියාත්මක කරනු ලබන විට, ජාතික ප්‍රසම්පාදන මගපෙන්වීමට අතිරේකව අවධානය යොමු කළයුතු කරුණු පහතින් වේ.

1. සමිති විසින් ගිවිසුම්ගත කර්මාන්ත ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමිතියේ දියුණුවට හා තම ප්‍රදේශය තමන් විසින්ම සංවර්ධනය කිරීමට යන හිමිකාරිත්වය සමිතියට අදාළ කර ගැනීම පිණිස වේ.

2. සමිති මගින් ගිවිසුම්ගත කර්මාන්ත ක්‍රියාත්මක කරනු ලබන විට, ව්‍යවස්ථාවට අනුකූලව ගිවිසුම්ගත මුළු මුදලින් 5%ක මුදල, සමිතියේ දියුණුව සඳහා පරිපාලන අරමුදල වශයෙන් සමිතිය සඳහා වෙන් කළ යුතුය.

3. සමිති, තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මායිමට ඔබ්බෙන් වූ කවර හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ගිවිසුම්ගත කර්මාන්ත සිදු කිරීමට නොහැකිය.

4. නිශ්චිත එක් සමිතියකට පමණක් ගිවිසුම්ගත කර්මාන්ත ලබා නොදී, ගිවිසුම්ගත කර්මාන්ත සාර්ථකව දියත් කිරීමට හැකි සමිතිවලට බෙදාදීම තුළින් කර්මාන්ත කඩිනම්ව හා කාර්යක්ෂමව මුදුන්පත් කරලීමට හැකිවීමත් සමග අදාළ සමිතිවල දියුණුවත් ප්‍රවර්ධනය කිරීමට හැකි වන්නේය.

5. ගිවිසුම්ගත කර්මාන්තය සම්පූර්ණ කර, භාර දෙන තෙක් ඒ හා සම්බන්ධිත ලේඛනවලට හා ක්‍රියාකාරකම්වලට අදාළවන සම්පූර්ණ වගකීම සමිතිය විසින් දැරිය යුතුය.

6. සියළුම ගිවිසුම් නිසි ක්‍රියාපටිපාටියට අනුකූලව (සමිති තේරීම, අනුමැතිය, මුදල් නිදහස් කිරීම, අධීක්ෂණය) ක්‍රියාත්මක වන බව ග්‍රාම සංවර්ධන නිලධාරියා විසින් සහතික කරලිය යුතුය. මේ සඳහාවන සම්පූර්ණ වගකීම ඔහු සතු වන්නේය.

7. ගිවිසුම්ගත කර්මාන්ත වල දී, ඒවාට අදාළවන සටහන් ක්‍රමවත්ව පවත්වාගෙන යාමත් සමග ග්‍රාම සංවර්ධන නිලධාරියාගේ නිසි අධීක්ෂණය තුළින් ප්‍රගතියේ සුවිශේෂී ඉලක්ක මට්ටම තහවුරු කළ යුතුය.

8. සමිති මගින් ක්‍රියාත්මක කරනු ලබන ගිවිසුම්ගත කර්මාන්තයන්හි සාරාංශ වාර්තාවේ (Summary Report) පිටපතක්, තම තමන්ගේ මාසික දින පොතේ (Monthly Diary Extract of Advanced Programme) උධෘතය සමග අමුණා, සෑම මසකම, මාසය අවසානයේ දී එවිය යුතුය. (ආදර්ශ ආකෘතිපත්‍රය අමුණා ඇත.)

ජේ.ජේ.ෆෙලිසියන්,
අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,

**<u>"දෙමළ බසින් - සිංහල බසට භාෂා පරිවර්තනය"</u>**

උතුරු පළාත.

පිටපත්:-

1. ලේකම්, ධීවර, ප්‍රවාහන, වෙළෙඳ හා වාණිජ, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන හා මෝටර් රථ වාහන ප්‍රවාහන අමාත්‍යාංශය, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
2. දිස්ත්‍රික් ලේකම්, ………………………….. - **කාරුණික දැන ගැනීම පිණිස.**
3. ප්‍රාදේශීය ලේකම්, ………………….. - **කාරුණික දැන ගැනීම පිණිස.**
4. දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරියා - **ක්‍රියාත්මක කරලීම පිණිස.**